සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## නර්තනය

**නම/විභාග අංකය :- ............................................................ කාලය: පැ. 01යි.**

◆සියළුම අයදුම්කරුවන් I කොටසේ ප්‍රශ්න 30ටම පිළිතුරු සැපයිය යුතුය. එයට අමතරව II උඩරට නර්තනය හෝ III පහතරට හෝ IV සබරගමු නර්තනය යන කොටස් තුනෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සැපයිය යුතුය.

<u>I කොටස</u>

◆ අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු පිළිතුර තෝරන්න.

(01) ''රටකට මවි සමගින් ඒ නැවි නැග'' මෙම කවිය අයත් වන්නේ.......................................... කවි ගායනා වලටය.

(1) සවරං (2) රබන් (3) කළගෙඩි (4) ගොයම් කැපුම

(02) මූලික සරඹ පුහුණු වීමේදී සමගුණය හා සිවි ගුණය වශයෙන් ද හඳුන්වයි.

(1) ද්‍රැත හා විලම්භ (2) මධ්‍ය හා ද්‍රැත (3) විලම්භ හා ද්‍රැත (4) විලම්භ හා මධ්‍ය

(03) නමස්කාර ගාථා ........................... කෙරෙහි භක්ති පූර්වකව කෙරෙන ගායනා විශේෂයකි.

(1) දෙවිවරුන් (2) යකුන් (3) ග්‍රහයින් (4) ත්‍රිවිධ රත්නය

(04) ''කරදිය'' මුද්‍රානාට්‍යයෙහි මන්නඩි රාළ සහ මකුළුවාගේ චරිතවල රංගනයෙහි යෙදෙනුයේ .................................. මහතා විසිනි.

(1) සේන වලවේ (2) මහින්ද ඩයස් (3) චිත්‍රසේන ඩයස් (4) ලයනල් අල්ගම

(05) සබරගමු නර්තනයේ හස්ත පාද හැසිරවීමේදී අනුගමනය කරන විධි ක්‍රමය ........................................... නමින් හඳුන්වයි

(1) ඉලංගම් සරඹ (2) දොඹින පද (3) ගොඩ සරඹ (4) මණ්ඩි ප ද

(06) නර්තනයේදී සිරුරේ අංග චලන අයත් වන්නේ .......................................... අභිනයටයි.

(1) ආහාර්ය (2) වාචික (3) සාත්වික (4) ආංගික

(07) උඩරට සම්ප්‍රදායට අයත් වන්නම් රචනා කිරීමේ අරමුණ වූයේ ........................................... යි

(1) පූජාර්ථය (2) විනෝදාස්වාදය (3) භක්තිය (4) ශාන්තිය

(08) ගැටබෙර වාදනයේදී බීජාක්ෂර ''තත්, ජිත්, තොං, නං වන අතර පහතරට බෙර වාදනයේදී බීජාක්ෂර වනුයේ ................................ ය.

(1) තා, ජිං, තොං, නං (2) තත්, තොං, ජිත්, නං

(3) තත්, දිත්, තොං, නං (4) තක, ජිත්, තොං, නං

(09) කථකලි ශිල්පියෙකු හිසට පළඳින ආභරණය ................................ නමින් හඳුන්වයි.

(1) ද්‍රපට්ඨා (2) කීරිටම් (3) කළුතාරම් (4) කොක්තුම්බි

(10) කතක් නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශයක් වශයෙන්................................හැඳින්විය හැකිය.

(1) දිල්ලිය (2) ඇසෑම් ප්‍රදේශය

(3) කේරලය (4) තාන්ජෝරය

(11) නර්තන අධ්‍යාපනයේ ප්‍රවර්ධනය සඳහා ඉමහත් සේවයක් ඉටු කළ ශිල්පිනිය වන්නේ,

(1) රජිනා සෙල්වනායගම් මහත්මියයි (2) ආචාර්ය වජිරා චිත්‍රසේන මහත්මියයි

(3) මිරැන්ඩා හේමලතා මහත්මියයි (4) පද්මිණී දහනායක මහත්මියයි

(12) ''විස්මය'' නැමැති ස්ථායි භාවයෙන් උපදින රසය

(1) ශෘංගාර රසයයි (2) හාස්‍ය රසයයි

(3) කරුණා රසයයි (4) අද්භූත රසයයි

(13) ''කුම්භී කථාව'' මුද්‍රා නාට්‍යයෙහි පිටපත සැකසූ ශිල්පිනිය

(1) අංජලිකා චිත්‍රසේන මහත්මියයි (2) වජිරා චිත්‍රසේන මහත්මියයි

(3) ශ්‍රිමති රසාදරී මහත්මියයි (4) ටානියා බැරකොමා මහත්මියයි

(14) ශ්‍රී ලංකාවේ මුද්‍රා නාට්‍ය කලාවේ ආරම්භයට මුල් වූ භාරතීය මුද්‍රා නාට්‍ය

(1) සීතාහරණය (2) ශාප් මොචන් ය

(3) මනෝහර බන්ධනම් ය (4) ඌර්වශී ජායම් ය

(15) හේවාහැට, බදුල්ල, කොණකලගල යන ප්‍රදේශවලට අයත් ගැමි නාටකය

(1) රූකඩය (2) නාඩගම් ය

(3) කෝලම් ය (4) සොකරි ය

(16) ''සකපෝරුව'' උපකරණයක් ලෙස භාවිතා වන ජීවන වෘත්තිය

(1) මැණික් කර්මාන්තයයි (2) මැටි කර්මාන්තයයි

(3) ධීවර කර්මාන්තයයි (4) කෘෂි කර්මාන්තයයි

(17) පුද්ගලයෙකුගේ බාහිර ස්වරූපය ඒ අයුරින්ම ඉදිරිපත් කරන අංග රචනය

(1) චරිතාංග අංග රචනයයි (2) විකාරරූපි අංග රචනයයි

(3) ස්වභාවික අංග රචනයයි (4) ශෛලිගත අංග රචනයයි

(18) ''හනික වරෙව් කොල්ලනේ''.... යන ගීතය අයත් වන අනුවර්තන නාට්‍ය වන්නේ,

(1) පද්මාවතී (2) බෙරහඬ (3) විදුර (4) කැළණි පාලම

(19) සොකරි නාටකයේ ආරම්භයේ සිට අවසානය දක්වා වැඩි වශයෙන් වාදනය කෙරෙන බෙර පදය

(1) දොං ජී ජිගත ය (2) ජිං කු ඥ කු ඥ ය (3) දෝං තකට ය (4) තකට කුජිං ය

(20) පොළොන්නරු යුගයේදී නැටුම්, ගැයුම්, වැයුම් සඳහා ඉදිකරන ලද සරස්වතී මණ්ඩපය සාදන ලද්දේ,

(1) පණ්ඩුකාභය රජු ය (2) මහා පරාක්‍රමබාහු රජු ය

(3) දුටුගැමුණු රජු ය (4) නිශ්ශංක මල්ල රජු ය


◆ අංක 21 - 23 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු පහත දැක්වෙන රූප රාමු ඇසුරින් තෝරන්න.



A



B



C



D

(21) කරදිය හා ගිනි හොරා යන මුද්‍රා නාට්‍ය නිර්මාණකරුවන්ගේ ඡායාරූපවලට අදාල අක්ෂර වන්නේ, පිළිවෙලින්

(1) C හා D ය
(2) A හා B ය
(3) D හා A ය
(4) B හා C ය

(22) ගොයම් කැපීමේ නර්තනය, නාරිලතා නැටුම....., ආදී නිර්මාණ බිහි කළ ශිල්පියාගේ/ශිල්පිනියගේ ඡායාරූපවලට අදාල අක්ෂරය වන්නේ,

(1) B ය.
(2) D ය.
(3) C ය.
(4) A ය.

(23) අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රථම නර්තන අධ්‍යක්ෂ ධූරය දැරූ ශිල්පියා/ශිල්පිනියගේ ඡායාරූපයට අදාළ අක්ෂර වන්නේ

(1) D ය.
(2) C ය.
(3) B ය.
(4) A ය.

(24) පොන්නානි හා සිංකිටි (සිංකිඩි) යන ගායකයන් දෙදෙනා දක්නට ලැබෙන්නේ,

(1) කථක් නර්තන සම්ප්‍රදායේ ය
(2) කථකලි නර්තන සම්ප්‍රදායේ ය
(3) මනිපුරි නර්තන සම්ප්‍රදායේ ය
(4) භරත නර්තන සම්ප්‍රදායේ ය

(25) පංච තූර්ය භාණ්ඩ වර්ගීකරණයේ දී පිළිවෙලින් බටනලාව, රබාන, දවුල අයත් වන්නේ,

(1) විතත, ආතත සහ සුසිර භාණ්ඩ වලට ය
(2) ඝනය, සුසිර සහ විතතාත භාණ්ඩ වලට ය
(3) සුසිර, ආතත සහ විතත භාණ්ඩ වලට ය
(4) සුසිර, ආතත සහ විතතාත භාණ්ඩ වලට ය

● ප්‍රශ්න අංක 26 සිට 28 දක්වා නිවැරදි පිළිතුර පහත වගුව ඇසුරෙන් තෝරන්න.

| | 1 | 2 | 3 |
|---|---|---|---|
| A | මල්මඩු පුරය | හත් පද පෙළපාලිය | මුදුන්තාලය |
| B | ගුරුගේ මාලාව | රාමා මැරීම | යක්කම් |
| C | දෙවොල් | කොහොඹා දෙවි | පත්තිනි |

(26) කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ දක්නට ලැබෙන නාට්‍යමය පෙළපාළි ඇතුලත් වන්නේ,

(1) A තීරුවෙහි 1 හා 2 හි ය
(2) B තීරුවෙහි 1 හා 2 හි ය
(3) B තීරුවෙහි 1 හා 3 හි ය
(4) A තීරුවෙහි 2 හා 3 හි ය

(27) දෙවොල් මඩුව හා පහන් මඩුව යන ශාන්ති කර්ම දෙකෙහිම පුද ලබන දෙවිවරු සඳහන් වන්නේ,

(1) C තීරුවෙහි 1 හා 3 හි ය
(2) C තීරුවෙහි 2 හා 1 හි ය
(3) C තීරුවෙහි 3 හා 2 හි ය
(4) B තීරුවෙහි 1 හා 2 හි ය

(28) සබරගමු සම්ප්‍රදායේ ගායනය සහිත නර්තන අංග දෙකක් දක්නට ලැබෙන්නේ

(1) A තීරුවෙහි 2 හා 3 හි ය
(2) A තීරුවෙහි 1 හා 2 හි ය
(3) A තීරුවෙහි 1 හා 3 හි ය
(4) c තීරුවෙහි 1 හා 2 හි ය

(29) පොළොන්නරු යුගයේදී දේවදාසින් නර්තනයේ යෙදුන බව සඳහන් වන්නේ,
(1) කොරවක්ගල සෙල්ලිපියෙහි ය
(2) සැස්සේරුව සෙල්ලිපියෙහි ය
(3) කොණකලගල සෙල්ලිපියෙහි ය
(4) පාලමොට්ටායි සෙල්ලිපිපියෙහි ය

(30) ''එදා හෙළදිව'' කෘතිය රචනා කරන ලද්දේ,
(1) ජෝන් ඩොයිලි විසිනි
(2) ජෝන් කැලවේ විසිනි
(3) රොබට් නොක්ස් විසිනි
(4) ස්පිල් බර්ජන් විසිනි

## II කොටස - උඩරට නර්තනය

(31) උඩරට නර්තන සම්ප්‍රදයේ මූලික අංගහාර සකස් කර ගැනීම සඳහා
(1) පා සරඹ හා දොඹින පද නිවරදිව අභ්‍යාස කළ යුතු වේ.
(2) ගොඩ සරඹ හා ඉලංගම් සරඹ නිවරදිව අභ්‍යාස කළ යුතු වේ.
(3) මණ්ඩිපද හා ගොඩ සරඹ නිවරදිව අභ්‍යාස කළ යුතු වේ.
(4) පා සරඹ හා ගොඩසරඹ නිවැරදිව අභ්‍යාස කළ යුතු වේ.

(32) මාත්‍රා 4+4 තනි තිතට හා මාත්‍රා 2 + 4 දෙතිතට නර්තනය කළ හැකි වන්නම් පිළිවෙලින් මෙසේ ය.
(1) සිංහරාජ වන්නම, තුරඟා වන්නම
(2) සිංහරාජ වන්නම, සැවුලා වන්නම
(3) වෛරෝඩි වන්නම, මුෂලඩි වන්නම
(4) සැවුලා වන්නම, සිංහරාජ වන්නම

(33) දොං ජිංත ගත දොංත වට්ටම නටනු ලබන තාල රූපය වන්නේ.......
(1) මාත්‍රා 2 + 2 + 3 තුන්තිතේ තාල රූපයයි
(2) මාත්‍රා 2 + 4 දෙතිතේ තාල රූපයයි
(3) මාත්‍රා 2 + 2 + 4 තුන් තිතේ තාල රූපයයි
(4) මාත්‍රා 2 + 3 දෙතිතේ තාල රූපයයි

(34) ''දුරත් බැලුම නොව ලඟත් බලන අය''................ මෙම කවි පදයේ ඉතිරි පද කොටස වන්නේ..........
(1) ''චිරත් කලෙක පැවතුමත් යසයි හැඩ'' ය
(2) "හටත් මෙලෙස වෙයි කැටත් තබම් දඩ'' ය
(3) ''ළිඳක් තුලක ඉබි ලඩෙක් කරපු වැඩ'' ය
(4) ''ඇරත් මෙහෙම යස වැඩක් උනේ නැත'' ය

(35) තත් තත් තත්කඩ කඩතක - ජිත් ජිත් ජික්කඩ කඩතක............ යනුවෙන් ආරම්භ වන්නේ,
(1) බඹර සරඹයට අයත් කස්තිරම වේ
(2) චන්ද්‍රිකා සරඹයට අයත් කස්තිරම වේ
(3) පැනීම් සරඹයට අයත් කස්තිරම වේ
(4) අංගහාර සරඹයට අයත් කස්තිරම වේ

(36) ගැටබෙරයෙන් වාදනය කළ හැකි බෙර පදයකි.
(1) දොං දොං ජිං, ජිං ගජිගත
(2) දොම් දොම් ගත, ගද්දිත්තකු
(3) ජිං කටිතත්, තත් කිටිතකු
(4) ජිංත තත්කිට, තකිට ජම්තකු

(37) මාත්‍රා 2 + 2 + 3 තුන් තිතට ප්‍රස්තාර කිරීමට සුදුස බෙර පදයකි.
(1) දොං ජිංත දොං ජිංත - ගත දොංත
(2) කුදාංත ගත කුද දොම්කිට - තරිකිට කුංදත් තා
(3) දොංතකු දොංතකු දොං ජිං - ගත්තත් ජිං තරිකිට
(4) දොංතකු දොංතකු දොංජිං කඩතක

(38) යහන, යක්ගෙය හා අයිලය මෙම සැරසිලි
(1) සොකරි නාටකයේදී දැකිය හැකිය
(2) කොහොඹා කංකාරි ශාන්ති කර්මයේදී දැකිය හැකිය
(3) බලි ශාන්ති කර්මයේදී දැකිය හැකිය
(4) දෙවොල් මඩු ශාන්ති කර්මයේදී දැකිය හැකිය

(39) මේවා කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ ගායනා සහිත නර්තන අංග වේ.
(1) හත් පදය, වාහල, මඩුපුරය
(2) කොහෙඹා හැල්ල, හත් පදය, යක් ඇණුම
(3) මඩු පුරය, අස්නේ, ආවැන්දුම
(4) අස්නේ, කොහොඹාහැල්ල, මඩුපුරය

(40) අවුල්හැරය, සිබා බන්ධනය, කෛමෙත්ත මෙම රංග වස්ත්‍රාභරණ අයත් වන්නේ,
(1) පබළු ඇඳුම් කට්ටලයට ය
(2) උඩැක්කි ඇඳුම් කට්ටලයට ය
(3) වෙස් ඇඳුම් කට්ටලයට ය
(4) තෙල්මේ ඇඳුම් කට්ටලයට ය

## පහතරට සම්ප්‍රදාය - III කොටස

(31) පහතරට නර්තන සම්ප්‍රදායේ මූලික අංගහාර සකස් කර ගැනීමට සඳහා
(1) පා සරඹ හා ගොඩසරඹ නිවැරදිව අභ්‍යාස කළ යුතු වේ.
(2) ඉලංගම් සරඹ හා දොඹින පද නිවැරදිව අභ්‍යාස කළ යුතු වේ.
(3) පා සරඹ හා දොඹින පද නිවැරදිව අභ්‍යාස කළ යුතු වේ
(4) පා සරඹ හා ඉලංගම් සරඹ නිවැරදිව අභ්‍යාස කළ යුතු වේ.

(32) මාත්‍රා 2 + 4 දෙතිතට හා මාත්‍රා 4 + 4 තනි තිතට නර්තය කළ හැකි සින්දු වන්නම් පිළිවෙලින් මෙසේ ය.
(1) අනුරාග දණ්ඩ තාලය, ලලිත රාග තාලය (2) නාතිලිංචි තාලය, අනුරාගදණ්ඩ තාලය
(3) අනුරාගදණ්ඩ තාලය, නාතිලිංචි තාලය (4) හනුමන්තා තාලය, නාතිලිංචි තාලය

(33) ගු-ද-ග-ති ග-ත ගු-ද ගත්-නම්..... මෙය ගුද ගති ගත වට්ටමේ
(1) කලාසමයි (2) කස්තිරමයි
(3) ඉරට්ටියයි (4) අන්තාඩියයි

(34) ''තරඟනා මැදිනා දිසි සුබුක රා'' මෙම කවි පදය ඇතුලත් වන්නේ,
(1) හනුමන්තා තාලයට ය (2) අනුරාග දණ්ඩ තාලයට ය
(3) ලලිතරාග තාලයට ය (4) ශුද්ධ තාලයට ය

(35) ගුහිති ගදිරිකිට ගුද ගුද ගුන්දිත් තා - ගහිති ගදිරිකිට ගත ගත ගත් දිත් තා........
මෙම පදය අයත් වන්නේ......
(1) 9 වන ඉලංගම් සරඹයට ය (2) 10 වන ඉලංගම් සරඹයට ය
(3) 11 වන ඉලංගම් සරඹයට ය (4) 12 වන ඉලංගම් සරඹයට ය

(36) පහතරට බෙරයෙන් වාදනය කළ හැකි බෙර පදයකි.
(1) ගුන්ද ගත්ගත ගත්ත ගුග්ගුද (2) ජෙං ජෙගත් තකු ජෙගත්
(3) කුංත ගජිගත ගත්ත කුජිගත (4) කිත්තත් කිත්තත් කිත්තත් ජෙං ජෙං

(37) මාත්‍රා 2 + 2 + 3 තුන් තිතට ප්‍රස්තාරගත කිරීමට සුදුසු බෙර පදයකි.
(1) රෙගත්-ගතකු දොම් ය (2) තක දිත්-තකු දොම් ය
(3) දිත්තම් දිතකු- දොම් දොම් තා ය (4) දොම් තම් ගත - ගදිතම් ගත ය

(38) තෙල්මේ නැට්ටුවාගේ අත්පන්දම් සහ දොළහා පෙළපාලියේ කුඩ, කොඩි, සේසත්...... යන රංග භාණ්ඩ දැකිය හැකි වන්නේ,
(1) කොහොඹා කංකාරි ශාන්ති කර්මයේදී ය (2) දෙවොල්මඩු ශාන්ති කර්මයේදී ය
(3) පහන් මඩු ශාන්ති කර්මයේදී ය (4) පහතරට බලි ශාන්ති කර්මයේදී ය

(39) පහතර රට නර්තන සම්ප්‍රදායට අයත් නර්තන අංග ලෙස සැලකෙන්නේ.
(1) තෙල්මේ, ආවැන්දුම හා ශුද්ධ මාත්‍රා ය (2) නානුමුරය, අස්නේ හා ශුද්ධ මාත්‍රා ය
(3) දෙවොල්, අස්නේ හා ශුද්ධ මාත්‍රා ය (4) තෙල්මේ, දෙවොල් හා ශුද්ධ මාත්‍රා ය

40) නළල්පටිය පබළු හැට්ටය, තෙල් කච්චිය අයත් වන්නේ.......
(1) සන්නි ඇඳුම් කට්ටලයට ය (2) දෙවොල් ඇඳුම් කට්ටලයට
(3) තෙල්මේ ඇඳුම් කට්ටලයට ය (4) වඩිග පටුන ඇඳුම් කට්ටලයට

## සබරගමු සම්ප්‍රදාය IV කොටස

(31) සබරගමු නර්තන සම්ප්‍රදායේ මූලික අංගහාර සකස් කර ගැනීම සඳහා
(1) පා සරඹ හා ගොඩ සරඹ නිවැරදිව අභ්‍යාස කළ යුතු වේ
(2) ඉලංගම් සරඹ හා දොඹින පද නිවැරදිව අභ්‍යාස කළ යුතු වේ
(3) පා සරඹ හා දොඹින පද නිවැරදිව අභ්‍යාස කළ යුතු වේ
(4) මණ්ඩිපද හා දොඹින පද නිවැරදිව අභ්‍යාස කළ යුතු වේ

(32) මාත්‍රා 3 + 4 දෙතිතට හා මාත්‍රා 4 + 4 තනි තිතට නර්තනය කළ හැකි වන්නම් පිළිවෙලින් මෙසේ ය.

(1) විරාඩි වන්නම, මණ්ඩුක වන්නම
(2) මණ්ඩුක වන්නම, විරාඩි වන්නම
(3) විරාඩි වන්නම, අනිලා වන්නම
(4) කෝකිල වන්නම, විරාඩි වන්නම

(33) ගමන් මාත්‍රය නර්තනය කරනු ලබන තාල රූපය වන්නේ

(1) මාත්‍රා 2 + 2 තනි තිතේ තාලයයි
(2) මාත්‍රා 4 + 4 තනි තිතේ තාලයයි
(3) මාත්‍රා 2 + 3 දෙතිතේ තාලයයි
(4) මාත්‍රා 3 + 3 තනි තිතේ තාලයයි

(34) ''අවිය රැගෙන යුදයටආ විලසට''..... මෙම කවි පදය අයත් වනුයේ

(1) කොවුලා වන්නමට ය
(2) මණ්ඩුක වන්නමට ය
(3) විරාඩි වන්නමට ය
(4) ආනන්ද වන්නමට ය

(35) කිත්තා කිත් තා ජේජ් ජෙජ් තා
තත්කඩ තරිකිට// ජෙජ් ජෙං තා...... මෙම පදය

(1) නමවන දොඹින පදයට ය
(2) දහවන දොඹින පදයට ය
(3) එකොලොස්වන දොඹින පදයට ය
(4) දොළොස්වන දොඹින පදයට ය

(36) සබරගමු දවුල් වාදනයට අදාළ වන පදයක් වන්නේ

(1) ජෙං ජෙගත් තකු ජෙගත්
(2) ගුන්ද ගත්ගත ගත්ත ගුග්ගුඳ
(3) කුංත ගජිගත ගත්ත කුජිගත
(4) ර්-රක් කිට කිට ර්-රක් ජෙං ජෙං

(37) මාත්‍රා 2 + 2 + 3 තුන් තිතට ප්‍රස්තාර ගත කිරීමට සුදුස බෙර පදයකි

(1) කුඳත් තක්කිට තකට ජිමිතකු ය
(2) ජිමිත කුඳා දොම් ය
(3) ජිං කුද ජිමිත ගත් තත් තකට ය
(4) ජිං කිටි තත් තත් කිටි තක ය

(38) තොරණ, මඩුව, කාලපන්දම් ගස මෙම සැරසිලි

(1) කෝලම් ගැමි නාටකයේදී දැකිය හැකිය
(2) සබරගමු පහන් මඩුවේදී දැකිය හැකිය
(3) බලි ශාන්ති කර්මයේදී දැකිය හැකිය
(4) කොහොඹා කංකාරියේදී දැකිය හැකිය

(39) සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් නර්තන අංග ලෙස සැලකෙන්නේ,

(1) තෙල්මේ, නේරංගම හා පට්ටුතාල් මාත්‍රයයි
(2) ගමන් මාත්‍රය, වඩිග පටුන හා පට්ටුතාල් මාත්‍රයයි
(3) මුදුන්තාලය, යහන් දැක්ම හා කෝල්පාඩුවයි
(4) මුදුන් තාලය, යහන් දැක්ම හා දේව කෝල් පාඩුවයි

(40) සබරගමු පබළු ඇඳුම් කට්ටලයට අයත් වේ

(1) අවුල් හැරය හා ඉන පටිය
(2) සිඛා බන්ධනය හා හැඩ කැල්ල
(3) නෙත්තිමාලය හා හැඩ කැල්ල
(4) කෙමෙත්ත හා නෙත්තිමාලය

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## නර්තනය

**නම/විභාග අංකය :- ............................................................** **කාලය: පැය 02යි.**

<u>II කොටස</u>

සැලකිය යුතුයි.

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) සියලුම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාල ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

(1) ''තුං තුඹ ගෙඩි තුනයි තුනයි - තිත්ත කැකිරි දෙකයි දෙකයි''..... මෙම රබන් පදය මාත්‍රා ....................... තාලයට වාදනය කරයි.

(2) ගද්‍ය හා පද්‍ය ලක්ෂණ දෙකම ඇතුලත් ගායනා විශේෂය .................................... නමින් හඳුන්වයි.

(3) කොහොඹා කංකාරියෙහි එන .................................. ගායනය රහිත නර්තන අංගයකි.

(4) රංග වස්ත්‍රාභරණ භාවිතය, වෙස් ගැන්වීම, වේදිකා උපකරණ, සැරසිලි... ආදිය භාවිතා වනුයේ .................. අභිනය තුළ ය.

(5) සත් පත්තිනි, ග්‍රහ අපලය... යන මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ................................මහතා විසිනි.

(6) කථකලි නර්තනය උගන්වල ප්‍රධාන ආයතනය වන්නේ.............................. යි.

(7) සොකරි සහ ගුරු හාමිගේ අතවැසියා වන ................................. මුඛරි බසින් යුක්ත වේ.

(8) සිංදු වන්නම් රචනා වූයේ දෙවිනුවර ................................. දේවාලයේදී ය.

(9) පහත දැක්වෙන නර්තන අංග ඇතුලත් ශාන්ති කර්ම දෙක නම් කරන්න.

(අ) තොරන් යාගය -

(ආ) කොළොන්න පද -

(10) පිළිවෙලින් ආමද්, තෝඩායම් යන නර්තන අංග දක්නට ලැබෙන නර්තන සම්ප්‍රදායන් දෙක නම් කරන්න.

(අ) ආමද් -

(ආ) තෝඩායම -

(02) (1) සිංහරාජ වන්නම හෝ අනුරාග දණ්ඩ තාල සිංදු වන්නම හෝ විරාඩි වන්නමට අයත් බෙර පදය ප්‍රස්ථාර කොට දක්වන්න. ( ල . 04)

(2) අතකට ගෙන රබන් පොඩිය වයති දි සිරුවින්
ගත සිත බඳ සොලවා සිලි සිලි නද කරමින්....
මෙම කවි පාද දෙක මාත්‍රා 3 + 3 තාල රූපයට ප්‍රස්තරා කරන්න. ( ල . 04)

(3) උඩරට සැවුළා වන්නම හෝ අනුරාග දණ්ඩතාලය සිංදු වන්නම හෝ මණ්ඩුක වන්නමට අයත් අඩව්වක්/ඉරට්ටියක් ප්‍රස්තාරගත කරන්න. ( ල . 04)

( ල . 12)

(03) පහත සඳහන් මාතෘකා අතුරෙන් <u>තුනක්</u> පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

(1) ගැමි නැටුම්

(2) වන්නම්

(3) වාචික අභිනය

(4) ටිකා සී පද

(5) නර්තන කලාව හැදෑරීමේ වැදගත් කම ( ල . 4 × 3 = 12)

(04) දේශීය ශාන්ති කර්මවල අන්තර්ගත චාරිත්‍ර විධි, ගායනා, වාදන, නර්තන හා සැරසිලි තුල සුවිශේෂී ලක්ෂණ පෙන්නුම් කරයි.

(1) කොහොඹා කංකාරිය ශාන්ති කර්මයේ එන චාරිත්‍ර විධි 02 ක් නම් කර ඉන් එකක් පිළිබඳව හඳුන්වන්න.( ල . 04)

(2) කෙහොඹා කංකාරිය/දොවොල් මඩුව/පහන් මඩුවේ දක්නට ලැබෙන ගායනා අංග 02 පිළිබඳ විස්තරයක් කරන්න. ( ල . 04)

(3) ඔබ උගත් ප්‍රධාන ශාන්ති කර්මයක රංග භූමිය සකස් කර ගන්නා ආකාරය පහත සඳහන් මාතෘකා යටතේ විමසීමක් කරන්න. ( ල . 04)

- සැරසිලි
- යොදා ගන්නා අමුද්‍රව්‍ය

(05) (1) ශ්‍රී ලංකාවේ නර්තන කලා ඉතිහාසය හා සම්බන්ධ ලිඛිත මූලාශ්‍ර දෙකක් හා පුරා විද්‍යාත්මක මූලාශ්‍ර දෙකක් නම් කරන්න. ( ල . 04)

(2) නර්තන කලාවේ උන්නතිය සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබූ බවට මහා වංශයෙන් සාධක දෙකක් ඉදිරිපත් කරන්න. ( ල . 04)

(3) දේශාඨන වාර්තාකරුවන් දෙදෙනෙකු නම් කර එම වාර්තාවල දැක්වෙන තොරතුරු අනුව එකල නර්තන කලාව පැවැති තත්ත්වය පිළිබඳ විස්තරයක් කරන්න. ( ල . 04)

(06) පහත දැක්වෙන රූපරාමු ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B



C



D

(1) A හෝ C රූපයේ දැක්වෙන මුද්‍රා නාට්‍ය නම් කර එම මුද්‍රා නාට්‍යයෙහි රංග රචනය හා රංග වස්ත්‍රාභරණ නිර්මාණයෙන් දායක වූ ශිල්පීන් දෙදෙනා නම් කරන්න. ( ල . 04)

(2) B රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය කුමක්ද? එම නර්තන සම්ප්‍රදායේ වේෂ නිරූපණය හා රංග වස්ත්‍රාභරණ පිළිබඳ විස්තරයක් කරන්න. ( ල . 04)

(3) D රූපයේ දැක්වෙන ගැමි නාටකය නම් කර එහි එන චරිත දෙකක් පිළිබඳ විග්‍රහයක් කරන්න. ( ල . 04)

(07) (1) සන්නිවේදනය සඳහා දේශීය වාද්‍ය භාණ්ඩ වාදනය කළ අවස්ථා හතරක් නම් කරන්න. ( ල . 04)

(2) ඉහත දැක්වූ වාදන අවස්ථා දෙකක් පිළිබඳ හැඳින්වීමක් කරන්න. ( ල . 04)

(3) බෞද්ධාගමික පුද පූජා පැවැත්වීමේදී වාද්‍ය භාණ්ඩ යොදාගත් ආකාරය පිළිබඳ විස්තරයක් කරන්න. ( ල . 04)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය -2020

## 10 - ශ්‍රේණිය

## නර්තනය පිළිතුරු

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 2 | (11) | 3 | (21) | 1 | (31) | 4 |
| (02) | 3 | (12) | 4 | (22) | 4 | (32) | 2 |
| (03) | 4 | (13) | 4 | (23) | 3 | (33) | 4 |
| (04) | 3 | (14) | 2 | (24) | 2 | (34) | 2 |
| (05) | 2 | (15) | 4 | (25) | 4 | (35) | 2 |
| (06) | 4 | (16) | 2 | (26) | 3 | (36) | 1 |
| (07) | 2 | (17) | 3 | (27) | 1 | (37) | 3 |
| (08) | 3 | (18) | 2 | (28) | 2 | (38) | 2 |
| (09) | 2 | (19) | 1 | (29) | 4 | (39) | 4 |
| (10) | 1 | (20) | 2 | (30) | 3 | (40) | 3 |

(ලකුණු 1 × 40 = 40)

### II කොටස

(01) (1) 3 + 3 (මාත්‍රා 3)
(2) ටීකා සී පද
(3) ආවැන්දුම/යක් ඇණුම/හත් පදය/දුණු මාලප්පුව
(4) ආහාර්ය
(5) එස්. පණිභාරත
(6) කේරළ කලා මණ්ඩලය
(7) පරයා
(8) උපුල්වන්
(9) (අ) දෙවොල් මඩු ශාන්ති කර්මය
(ආ) පහන් මඩු ශාන්ති කර්මය
(10) (අ) කථක් නර්තන සම්ප්‍රදාය
(ආ) කථකලි නර්තන සම්ප්‍රදාය

ප්‍රශ්න අංක 1 - 8 දක්වා ලකුණු 1 × 8 = 8 යි
ප්‍රශ්න අංක 9 - 10 දක්වා ලකුණු 2 × 2 = 4 යි
මුළු ලකුණු = 8 + 4 = 12

(02) (1) බෙර පදය නිවැරදිව ප්‍රස්ථාර කිරීම (ලකුණු 02)
කවිපාද දෙක නිවැරදිව ප්‍රස්ථාර කිරීමට (ලකුණු 02)
(මුළු ලකුණු = 2 × 2 = 04)

(2) කවිපාද දෙක නිවැරදිව ප්‍රස්ථාර කිරීමට (ලකුණු 02)
නිවැරදි සංකේත භාවිතය සහ ආවර්ත බෙදා දැක්වීමට (ලකුණු 02)
(මුළු ලකුණු 2 × 2 = 04)

(3) අඩව්ව/ඉරට්ටිය නිවැරදිව ප්‍රස්ථාර කිරීමට (ලකුණු 02)
නිවැරදිව සංකේත භාවිතය සහ ආවර්ත බෙදා දැක්වීමට (ලකුණු 02)
(මුළු ලකුණු 2 × 2 = 04)

(2වන ප්‍රශ්නය සඳහා මුළු ලකුණු = 4 × 3 = 12)

(3) මාතෘකා තුනක් පිළිබඳ කෙටි සටහන් ලිවීමට (ලකුණු 3 × 4 = 12)
(පිළිගත හැකි නිවැරදි කරුණු අවම වශයෙන් පහකට නොඅඩුව තිබේ නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න)

(04) (1) චාරිත්‍ර විධි 02ක් නම් කිරීමට (ලකුණු 02)

චාරිත්‍ර 01ක් පිළිබඳ හැඳින්වීමට (ලකුණු 02)

(ලකුණු 2 × 2 = 04)

(2) ශාන්ති කර්ම ත්‍රිත්වයටම පොදු ගායනා ඇති බව,

- අසාතාත්මක හා අනාසාතාත්මක ගායනා විශේෂ ඇති බව
- ආසාතාත්මක කවි ගායනා වශයෙන් සිරස පාද, කඩතුරා කවි, කෝල්මුර කවි, උපත් කවි දැක්විය හැකි බව
- අනාසාතාත්මක කවි ගායනා වශයෙන්, නමස්කාර, අෂ්ඨක, ශ්ලෝක, සන්න, සැහැලි, යාදිනි දැක්විය හැකි බව.
- ඉහත දක්වන ලද ගායනා පොදුවේ දක්නට ඇතත් සම්ප්‍රදායන්ට අනුව ආවේනික වූ නාදමාලාවන්ට අනුව ගායනා කරන බව
- ශාන්ති කර්මවල අරමුණු අනුව උපත් කථා විස්තර කිරීම, දෙවියන් වැඩම වීම, දොස් දුරු කිරීම, රෝග නිවාරණය, සෙත් පැතීම වැනි ගායනාවල විවිධත්වයක් දක්නට ලැබෙන බව
- සම්ප්‍රදායන් තුනට අනුව වෙන් වෙන් වශයෙන් හෝ පිළිතුරු ලිවීම...

(මෙවැනි කරුණු දක්වා ඇතොත් සම්පූර්ණ ලකුණු පිරිනමන්න)

(මුළු ලකුණු = 04)

(3) <u>සැරසිලි</u> (ලකුණු 02)

- කොහොඹා කංකාරියේ,
  පස්වලු එල්ලා සරසල ලද මඩුව
  අයිලය
  යක්ගෙය
  යහන
- පහතරට දෙවොල් මඩුවේ
  දොවොල්ගෙය
  මල් යහන්
  කාල පන්දම් ගස (ගොප් කොළ දම්වැල්වලින් සරසන ලද උස පුවක් ගසක් මුදුනේ පන්දමක් සවි කර ඇත)
  මඩුව
  දෙවොල් තොරණ
- සබරගමු පහන් මඩුවේ
  තොරණ
  මඩුව
  කාල පන්දම් ගස
  මල් යහන්

<u>යෙදා ගන්නා අමුද්‍රව්‍ය</u>

පරිසරයෙන් සොයා ගන්නා ලද ලී කෝටු, කෙසෙල් පතුරු, මඩු, ගොප් කොළ, පුවක් මල්, පොල් මල්, තැඹිලි, බෝදිලි, දෝතලු, කොසෙල්ගස්. කෙසෙල් කැන... ආදිය භාවිතා කරමින් ඒ ඒ සම්ප්‍රදායන්ට අනුව සැරසිලි හා මෝස්තර කරගනු ලබන බව... (මුළු ලකුණු 2 × 2 = 04)

(05) (1) <u>ලිඛිත මූලාශ්‍ර</u> (ලකුණු 02)

1. වංශ කථා
2. සංදේශ කාව්‍ය හා සාහිත්‍ය කෘති
3. දේශාඨන වාර්තා
4. සෙල්ලිපි

<u>පුරා විද්‍යාත්මක මූලාශ්‍ර</u> (ලකුණු 02)

1. රූකම්/කැටයම්
2. සෙල්ලිපි

(මුළු ලකුණු 2 × 2 = 04)

(2) රාජ්‍ය අනුග්‍රහය ලැබූ බවට මහා වංශයෙන් සාධක 02ක් ඉදිරිපත් කිරීම

- පණ්ඩුකාභය රජු විසින්,
  චිත්තරාජ හා කාලවේල යන යක්ෂයන් දෙදෙනා උදසා සම අසුන් පනවා තමා ඉදිරියේ දෙව් මිනිස් නැටුම් කරවූ බව...
- දුටුගැමුණු රජු විසින්,
  නළඟනන් පිරිවරාගෙන කණ්ඩුල ඇතු පිට නැගී රුවන් වැලි සෑයේ ධාතු නිදන් කිරීමේ උත්සවයට පංචතූර්ය වාදන සහිතව ගිය බව...
- භාතිකාභය රජු විසින්
  මහබෝධියට බෝධි ස්නාන පූරාවක් පැවැත් වූ බවත් එහිදී නැටුම් හා තූර්ය වාදන පැවැත් වූ බව...
- මහා පරාක්‍රමබාහු රජු විසින්
  නැටුම්, ගැයුම්, වැයුම් සඳහා සරස්වති මණ්ඩපය ඉදි කළ බවත් එහි දක්ෂ නළු නිළියන් යෙදවූ බවත්...
  නැටුම් ගැයුම් වැයුම් සඳහා විශාල රාජ අනුග්‍රහයක් ලබා දුන් බවත්...

(ඉහත දැක්වූ රජවරු දෙදෙනෙක් පිළිබඳව තොරතුරු දක්වා ඇත්නම්)

(ලකුණු 2 × 2 = 04)

(3) ඉබන් බතූතා<br>ස්පිල් බර්ජන්<br>රොබට් නොක්ස් } මින් දෙදෙනෙකු නම් කිරීමට (ලකුණු 02)

වාර්තා ඇසුරින් නර්තන කලාව එකල පැවැති තත්ත්වය පිළිබඳ පැහැදිලි කිරීම (ලකුණු 02)

- ඉබන් බතූතාගේ වාර්තාව
  ''දෙව් නුවර උපුල්වන් දේවාලයේ... සාධකය ලියා එකල නර්තන කලාවට භාරතීය ආභාෂය ලබා තිබූ බව, (දේවදාසි සංකල්පය) දෙවියන් පිනවීම සඳහා නර්තනය යොදා ගෙන ඇති බව...
- ස්පිල්බර්ජන් ගේ වාර්තාව
  ''මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සනට නටත්''... සාධකය ලියා
  එකල මහනුවර පෙරහැරේ රූමත් කාන්තාවන් නටා ඇති බවත්, අලංකාර රංග වස්ත්‍රාභරණ පැළඳ නර්තනයේ යෙදී ඇති බවත්...
- රොබට් නෝක්ස්ග් වාර්තාව
  ''එහි දේවාල විහාරවල තේවාව සඳහා නියම වූ කුලවලින් පැමිණ... සාධකය ලියා එකල ගැමි නැටුම් මහනුවර පෙරහැරේ නටා ඇති බවත්, කාන්තාවන් පෙරහැරේ නටා ඇති බව, දේවාල විහාරවල තේවාව සඳහා නියම වූ කුලවලින් පැමිණ කළගෙඩි සෙල්ලමේ (නර්තනයේ) යෙදී ඇති බවත් නර්තන කුල පරම්පරාවෙන් එකල සිට ඇති බවත්...

  (ආදී වශයෙන් වාර්තාකරුවන් දෙදෙනෙකුගේ වාර්තා පිළිබඳ අදහස් දක්වා තිබීම)

(ලකුණු 2 × 2 = 04)

(මුළු ලකුණු = 4 × 3 = 12)

(06) (1) A රූපය, කරදිය මුද්‍රා නාට්‍ය (ලකුණු 02)

- රංග රචනය
  චිත්‍රසේන ඩයස් මහතා
  වජිරා චිත්‍රසේන මහත්මිය (ලකුණු 02)
- රංග වස්ත්‍රාභාරණ නිර්මාණය
  සෝමබන්ධු විද්‍යාපති මහතා
  හෝ

C රූපය, කුඹී කථාව මුද්‍රා නාට්‍ය (ලකුණු 02)

- රංග රචනය
  අංජලිකා චිත්‍රසේන මහත්මිය
- රංග වස්ත්‍රාභාරණ නිර්මාණය (ලකුණු 02)
  මහෝෂ් උමගිලිය මහතා

(2) B රූපය, කථකලි නර්තන සම්ප්‍රදාය (ලකුණු 01)

- කථකලි නර්තන සම්ප්‍රදාය ආහාර්‍ය අභිනය අතින් පොහොසත් බව
- චරිතවලට අනුව ඉතා විචිත්‍රවත් අයුරින් සැකැසුණු රංග වස්ත්‍රාභරණ හා ඊටම සැකසුනු සංකීර්ණ වේෂ නිරූපන භාවිතා කරන බව
- වේෂ නිරූපන ශිල්පියා ''පත්තුකාරන්'' ලෙසින් හඳුන්වන බව
- චරිත වර්ග කොටස් හයකට බෙදා දක්වෙන බව
  මිනිත්තු, පච්චා, කත්ති, කාඩි, කාරි, ඩෙප්පු (මූලික අංග රචනය)
- හිස් පළඳනා වශයෙන් ක්‍රිටම් (ඔටුණු) වර්ග තුනක් භාවිතා වන බව
- රංග වස්ත්‍රාභරණ
  කිරීටම්, කළුකාරම්, කුප්පායම්, උත්තරියම් ග්‍රෝරි... ආදී වශයෙන් ඉහත කරුණු දක්වා පිළිතුරු අදාළ ලෙස ලියා තිබීම (ලකුණු 03)
  (චරිත වර්ග හය රංගවස්ත්‍රාභරණ පිළිබඳ විස්තර කර ඇත්නම් මුළු ලකුණු පිරිනමන්න)

(ලකුණු 1 + 3 = 04)

(3) D රූපය, සොකරි ගැමි නාටකය (ලකුණු 01)

- චරිත - සොකරි, ගුරුහාමි (අඬිගුරු) වෙදරාළ, පරයා, සොත්තානා (චරිත 2ක් නම් කිරීමට) (ලකුණු 01)
- එක් චරිකයක් පිළිබඳ විග්‍රහ කිරීමට (ලකුණු 02)
  (චරිතයේ ස්වභාවය, රංග වස්ත්‍රාභරන, චරිත නිරූපනයේදී යොදා ගන්නා ගායනය (කවි) වාදනය, නර්තන ශෛලීය ආදිය පිළිබඳ ලියා තිබීම) (ලකුණු 1+ 1 + 2 = 04)

(මුළු ලකුණු 4 × 3 = 12)

(07) (1) අණබෙර, රණබෙර, වද බෙර, මළ බෙර, හේවිසි (මින් 4ක් නම් කිරීමට) (ලකුණු 04)

(2) ඉහත දැක්වූ වාදන අවස්ථා දෙකක් පිළිබඳව නිවැරදිව විස්තර කිරීමට (ලකුණු 2 × 2 = 04)

(3)
- ආගමික සිද්ධස්ථාන ආශ්‍රිතව පුදපූජා සඳහා බහුලව යොදා ගැනෙන හේවිසි වාදනය සිදු කර ඇති බව
- අලුයම් ධූරය, මැදියම් ධූරය, හැන්දෑ ධූරය වැනි දෛනිකව කෙරෙන වාදන අංග යොදා ගත් බව
- දළදා වහන්සේ වෙනුවෙන් කෙනෙර විශේෂිත බෙර වාදන අතර අඹරා හේවිසි සහ ගෙවැදුම් හේවිසි නමින් වාදන සිදු කර ඇති බව
- පෙරහැර මංගල්‍යය සඳහා (දළදා, කතරගම, සමන් දේවාල ආදි)
- හේවිසි වාදනයේදී දවල, තම්මැට්ටම හා හොරණෑව යොදාගෙන ඇති බව
- ඉහත දැක්වූ වාදන අවස්ථා සඳහා සුවිශේෂී වූ බෙර පද වෙන් වෙන් වශයෙන් වාදනය කරනු ලබන බව

C ....... ආදි වශයෙන් උදාහරණ සමඟ පිළිතුරු ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න) (ලකුණු 04)

(මුළු ලකුණු = 4 × 3 = 12)

I පත්‍රය සඳහා මුළු ලකුණු = 1 × 40 = 40

II පත්‍රය සඳහා මුළු ලකුණු = 12 × 5 = 60

I සහා II පත්‍රය සඳහා මුළු ලකුණු = 100